සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade: 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I, II | කාලය / காலம் / Time: පැය 2 යි

නම / பெயர் / Name: ............ විභාග අංකය / சுட்டிலக்கம் / Index No.: ............

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවල වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. මහා සුළඟක් සමඟ වර්ෂාවක් ඇති වූ නිසා එම වර්ෂාවෙන් බුදුරජාණන් වහන්සේ ආරක්‍ෂා කිරීමට මුචලින්ද නම් නාගරාජයා ඉදිරිපත් වූයේ බුද්ධත්වයෙන්,
   1. පළමුවන සතියේ ය.
   2. තුන්වන සතියේ ය.
   3. හයවන සතියේ ය.
   4. හත්වන සතියේ ය.

02. බුදුරජාණන් වහන්සේ පළමු සතිය ගත කිරීමෙන් පසු උන්වහන්සේට අත්සුණු හා මී පිඩු පූජා කළ තපස්සු හා භල්ලුක දෙදෙනා,
   1. ගොවියෝ ය.
   2. රාජපුරුෂයෝ ය.
   3. වෙළෙන්දෝ ය.
   4. බමුණෝ ය.

03. බුදුරජාණන් වහන්සේගේ ගුණ විස්තර කරමින් 'බුදුගුණාලංකාරය' නම් කෘතිය රචනා කරන ලද්දේ,
   1. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසිනි.
   2. වීදාගම මහා මෛත්‍රීය හිමියන් විසිනි.
   3. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමියන් විසිනි.
   4. ඇම්. ඇල්. සිල්වා ගුරු මුහන්දිරම් තුමා විසිනි.

04. නිවන් පතන මෙත් වඩන්නෙකු තුළ තිබිය යුතු ගුණාංග ඇතුළත් කළ සූත්‍රයක් වන්නේ,
   1. දම්සක් පැවතුම් සූත්‍රය යි.
   2. මහා මංගල සූත්‍රය යි.
   3. රතන සූත්‍රය යි.
   4. කරණීයමෙත්ත සූත්‍රය යි.

05. ගිහියාගේ නිත්‍ය ශීලය ලෙස සැලකෙන්නේ,
   1. පංච ශීලය යි.
   2. උපෝසථ අෂ්ටාංග ශීලය යි.
   3. ආජීව අෂ්ටමක ශීලය යි.
   4. දස සීලය යි.

- **අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද යොදන්න.**

06. සිගාලෝවාද සූත්‍රයට අනුව ගුරුවරුන් උපමා කොට ඇත්තේ බටහිර දිශාවට ය. (.........)

07. ඥානවන්ත ව ක්‍රියා කළ හා අඥාන ව ක්‍රියා කළ වෙළඳ නායකවරුන් දෙදෙනෙකු පිළිබඳ ව අපණ්ණක ජාතකයෙන් කියවේ. (.........)

08. ඉවසීමේ ගුණාංගය මැනවින් ප්‍රකට කෙරෙන කතා පුවතේ සිටි සුනාපරන්තයට වැඩම කිරීමට සූදානම් වූ භික්‍ෂූන් වහන්සේ වූයේ පුණ්ණ හිමියන් ය. (.........)

09. බුදුරජාණන් වහන්සේගේ අනිමිස ලෝචන පූජාවෙන් ප්‍රකට වූයේ කළගුණ සැලකීමේ ගුණය යි. (.........)

10. ධනය රැස්කොට නොකා නොබී මිය යන්නෝ 'උදුම්බරඛාදිකයෝ' ය. (.........)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

11. ලෝකයාට ධර්මය දේශනා කරන ලෙස ................................ විසින් බුදුරජාණන් වහන්සේට ආරාධනා කරන ලදි.

12. අනේපිඬු සිටුතුමාගේ මුල් නම වූයේ ................................... ය.

13. බුදු සසුනේ අග්‍ර දායිකාව වූයේ ................................ යි.

14. 'පව් නම් නරකමය' යන කවිය ඇතුළත් කෘතිය ..................................... යි.

15. තමා උපමාවට ගෙන අන් අයට හිංසා පීඩා නොකිරීම ................................... නම් වේ.

(අත්තුපනායික ධර්මය, සුදත්ත, උදේන, සහම්පති බ්‍රහ්මයා, සිරිත් මල්දම, ලෝවැඩ සඟරාව, විශාඛා උපාසිකාව, ආනන්ද හිමියන්)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා 'A' කොටසට ගැළපෙන පිළිතුර 'B' කොටසින් තෝරා යා කරන්න.**

| | A | B |
|---|---|---|
| 16. | බෞද්ධයාගේ අත්පොත | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| 17. | පාරිභෝගික චෛත්‍යය | පිරුවානා පොත් වහන්සේ |
| 18. | මිගාර මාතා | ධම්මපදය |
| 19. | ෂඩ්භාෂා පරමේශ්වර | විශාඛා මහෝපාසිකාව |
| 20. | තුන් සූත්‍රය | බෝධීන් වහන්සේ |

(ලකුණු 2 X 20 = 40)

## II කොටස

- **පළමු ප්‍රශ්නයට පිළිතුරු සැපයීම අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය සහ තවත් ප්‍රශ්න 04 ක් ඇතුලුව ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.**

01. තෙවන වාරයේ බුද්ධ ධර්මය විෂයට සමගාමී ව පාසල් පාදක තක්සේරුව සඳහා ඔබ විසින් සිදුකරන ලද ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු ලියන්න.

i. මෙම ඇගයීම සඳහා ඔබ යොදාගත් පාඩමේ නම කුමක් ද?

ii. ඇගයීම සිදු කිරීමට පෙර ඔබට ලැබුණු ගුරු උපදෙස් දෙකක් ලියන්න.

iii. ඔබේ සාකච්ඡා මණ්ඩපයට ඔබ තොරතුරු සපයාගත් මූලාශ්‍ර දෙකක් ලියන්න.

iv. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.

v. මෙම ඇගයීම සිදු කිරීමෙන් ඔබ තුළ දියුණු වූ කුසලතා දෙකක් ලියන්න.

vi. බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ධර්ම දේශනාව ඇතුළත් සූත්‍ර දේශනාව කුමක් ද?

vii. තණ්හාව බෙදෙන ආකාර තුනෙන් දෙකක් ලියන්න.

viii. 'අත්තකිලමථානුයෝගය' යනු කුමක් දැයි හඳුන්වන්න.

ix. ආර්ය අෂ්ටාංගික මාර්ගයේ සඳහන් අංග අටෙන් දෙකක් ලියන්න.

x. ශිෂ්‍යයෙකු වශයෙන් නිවැරදි සිහියෙන් යුක්ත ව කටයුතු කිරීමෙන් ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.
(ලකුණු 2 x 10=20)

02. i. බුදුරජාණන් වහන්සේගෙන් පිහිට ලැබූ අසරණ පුද්ගලයන් දෙදෙනෙකු නම් කරන්න. (ලකුණු 02)

ii. එසේ පිහිට ලැබූ එක් අයෙකු පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03)

iii. පාසල් ශිෂ්‍යයෙකු වශයෙන් ඔබට අසරණයන්ට පිහිට විය හැකි අවස්ථා 05 ක් ලියන්න. (ලකුණු 05)

03. i. චාරිත්‍ර හා වාරිත්‍ර යන වචන හඳුන්වන්න. (ලකුණු 02)

ii. ඔබ විසින් නිවසේ දී අනුගමනය කළ යුතු විරිත් 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. සිරිත් හා විරිත් අනුගමනය කිරීමෙන් ඔබට ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න. (ලකුණු 05)

04. i. 'අක්කොච්ඡි මං අවධි මං
..........................................
..........................................
වේරං තේසං න සම්මති' මෙම ගාථාවේ මැද පද දෙක සම්පූර්ණ කර ලියන්න. (ලකුණු 02)

ii. එම ගාථාවේ අදහස ලියන්න. (ලකුණු 03)

iii. වෛර නොකිරීමෙන් ලැබෙන යහපත් ප්‍රයෝජන 05 ක් ලියන්න. (ලකුණු 05)

05. i. බුදු දහමේ ඉගැන්වෙන නියාම ධර්ම පහෙන් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ගිරිමානන්ද සූත්‍රයේ සඳහන් රෝග හටගන්නා ක්‍රම 03 ක් ලියන්න. (ලකුණු 03)

iii. විභාගයෙන් අසමත් වූ ඔබේ මිතුරාව ධෛර්යමත් කිරීමට ඔබ දෙන උපදෙස් 05 ක් ලියන්න. (ලකුණු 05)

06. i. මිහිඳු මාහිමියන් ලක්දිවට වැඩම කළ පොහොය දිනය හා ස්ථානය නම් කරන්න. (ලකුණු 02)

ii. උන්වහන්සේ සමඟ වැඩම කළ පිරිසෙන් 03 දෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

iii. අතීත උරුම ආරක්ෂා කිරීමට ඔබ කළ යුතු වන්නේ මොනවා දැයි දක්වමින් වාක්‍ය 05 ක් ලියන්න. (ලකුණු 05)

07. පහත සඳහන් මාතෘකාවලින් දෙකකට කෙටි සටහන් ලියන්න.

i. පංච ශීලය

ii. ශාසනික වචන ව්‍යවහාරය

iii. අග්‍රශ්‍රාවක දානය

iv. අරහං බුදු ගුණය (ලකුණු 05 x 02 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

ශ්‍රේණිය / தரம் / Grade 07 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය - පිළිතුරු පත්‍රය | පත්‍රය / வினாத்தாள் / Paper I, II | කාලය / காலம் / Time

නම / பெயர் / Name ........................................ විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ........................................

I කොටස

| අනු අංකය | පිළිතුර | අනු අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 03 | 11 | සහම්පතී බ්‍රහ්මයා |
| 02 | 03 | 12 | සුදත්ත |
| 03 | 02 | 13 | විශාඛා උපාසිකාව |
| 04 | 04 | 14 | සිරිත් මල්දම |
| 05 | 01 | 15 | අත්තූපනායික ධර්මය |
| 06 | x | 16 | ධම්මපදය |
| 07 | ✓ | 17 | බෝධීන් වහන්සේ |
| 08 | ✓ | 18 | විශාඛා මහෝපාසිකාව |
| 09 | ✓ | 19 | තොටගමුවේ ශ්‍රී රාහුල හිමි |
| 10 | x | 20 | පිරුවානා පොත් වහන්සේ |

II කොටස

01. i. චතුරාර්ය සත්‍යය

ii. පාඩම හොඳින් කියවා කරුණු රැස්කර ගන්න.

සහයෝගයෙන් එකිනෙකා සමඟ කටයුතු කරන්න.

තම දැනුම කණ්ඩායමේ සෙසු අය සමඟ බෙදා ගන්න.

ගැටලු මතුවන තැනක් වෙතොත් තමන් (බුද්ධ ධර්මය ගුරුවරයා) මුණගැසී විමසන්න ආදි වශයෙන් බලා ලකුණු පිරිනමන්න.

iii. පෙළ පොත, පුස්තකාලයෙන් ලබාගත් කිසියම් පොතක් (පොතේ නම ලිවිය යුතු ය), වෙනත් දහම් පොත්, බුදුසරණ පත්තරය, සඟරා ලිපි, අන්තර්ජාලය ආදි වශයෙන්

iv. කණ්ඩායමේ ඇතැම් සිසුන් නිසි ලෙස සහයෝගය නොදැක්වීම, ඇතැම් සිසුන් වගකීම් පැහැර හැරීම, ඇතැම් සිසුන් සාකච්ඡා කරන දිනට නොපැමිණීම ආදි වශයෙන් බලා ලකුණු පිරිනමන්න.

v. කණ්ඩායම් හැඟීමෙන් වැඩ කිරීමට පුරුදු වීම, අන්මතවලට ද සවන් දිය යුතු බව වැටහීම, සැමදෙනා ම එකමුතු ව තබා ගන්නා ආකාරය දියුණු කරගැනීම, සාකච්ඡා ක්‍රමයෙන් විෂය කරුණු වැඩි දියුණු වන බව අවබෝධ වීම ආදි වශයෙන්

vi. දම්සක් පැවතුම් සූත්‍රය

vii. කාම තණ්හා, භව තණ්හා, විභව තණ්හා

viii. තමා විසින් තමාට ම අසීමිත ලෙස දුක් දීම යි / සිය කැමැත්තෙන් ම දුෂ්කර ව්‍රත අනුගමනය කිරීම යි / තමා විසින් තමාව ම වෙහෙසට පීඩාවට පත් කර ගැනීමයි.

ix. සම්මා දිට්ඨි, සම්මා සංකප්ප, සම්මා වාචා, සම්මා කම්මන්ත, සම්මා ආජීව, සම්මා වායාම, සම්මා සති, සම්මා සමාධි.

x. අධ්‍යාපන කටයුතුවලට මනා සහයක් ලැබීම / අන් අය සමඟ කටයුතු කිරීමට පහසු වීම / එදිනෙදා වැඩ කටයුතු මනා පිළිවෙළකින් යුක්ත ව සිදු කිරීමට හැකි වීම ආදිය.

02. i. අසරණ මහලු පියා, වරදට හසු වූ නිවැරදි ගොවියා, සෝපාක, පටාචාරා, පූතිගත්ත තිස්ස හිමි

ii. **අසරණ මහලු පියා**

එක්තරා දරුවන් සතර දෙනෙකු සිටි පිය කෙනෙක් හොඳින් දරුවන්ට උගන්වා යුතුකම් කොට තම සියලු ධනය ඔවුනතර බෙදා දුන්න ද ටික කලකින් ඔවුන් ඔහුව අමතක කිරීම නිසා අසරණ ව මහමඟට වැටුණි. මෙය දුටු බුදුරජාණන් වහන්සේ දරුවන්ගේ අකටයුතුකම් කියැවෙන ගාථා හතරක් ඔහුට උගන්වා මිනිසුන් ඒකරාශී වන තැන්වල ඒවා හඬනගා පවසන ලෙස පැවසූ සේක- ඒවා ඇසීමෙන් මිනිසුන් අප්‍රසාදය පළ කළ අතර එම දරුවෝ සිව්දෙනා ප්‍රසිද්ධියේ සිය පියාගෙන් සමාව ගෙන ඔහුව නිසි ලෙස රැකබලා ගත්හ.

**වරදට හසු වූ නිවැරදි ගොවියා**

සොර මුළක් පෙර දින රාත්‍රියක නිවසක් බිඳ එකතු කරගත් මසුරන් දහසක පසුම්බියක් අතපසු වීමකින් එක්තරා ගොවියෙකුගේ කුඹුරක දමා ගොස් තිබුණු අතර උදෑසන කුඹුරට පැමිණි ගොවියා එය අහුලාගෙන පසෙකින් තබා තම වැඩෙහි නිරත ව සිටියේ ය. ඔහු පත්වන අනතුර දුටු බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන් සමඟ එහි වැඩම කොට කහවණු පසුම්බිය දෙස බලා ''ආනන්ද, සර්පයා දුටුවේ ද?'' යි ප්‍රශ්න කළ අතර ''එසේ ය, දිටිමි ස්වාමීනී'' යි ආනන්ද හිමියෝ පිළිතුරු දුන්හ. පසුව රාජ පුරුෂයන් පැමිණ ගොවියා ව අත්අඩංගුවට ගෙන රජුට ඉදිරිපත් කළ අතර බුදුරජාණන් වහන්සේ ඇසූ ප්‍රශ්නයත් ආනන්ද හිමියන් දුන් පිළිතුරත් නිතර මුමුණමින් සිටි හෙයින් ඔහුව ගෙන්වා රජු මේ පිළිබඳ කරුණු විමසුයෙන් ඔහු නිවැරදිකරුවකු බව දැන නිදහස් කළේ ය.

**සෝපාක**

සෝපාකගේ පියා මිය ගිය පසු මව විවාහ කරගත් දෙවන සැමියා නිතර ඔහුට වධහිංසා පැමිණවී ය- දිනක් ඔහුව අමුසොහොනකට ගෙන ගොස් මළ මිනියකට බැඳ ඔහුව මැරෙන්නට අතහැර දමා පැමිණියේ ය. ඒ අවස්ථාවේ මහා කරුණාවෙන් එම ස්ථානයට වැඩම කළ බුදුරජාණන් වහන්සේ ඔහුව බැම්වලින් මුදා ගෙනගොස් පැවිදි වීමට අවස්ථාව උදාකර දුන්හ.

**පටාචාරා**

පටාචාරා තම දෙවන දරුවා ලැබීමට සිටිය දී තම සැමියා සමඟ දෙමාපියන්ගේ නිවසට යමින් සිටියා ය. එදින රාත්‍රියේ ඇගේ සැමියාට සර්පයෙකු දෂ්ට කළ හෙයින් ඔහු මිය ගිය අතර පසුදින පළමු ලැබුණු දරුවා ගඟට වැටී මිය ගිය අතර අලුත උපන් දරුවා උකුස්සෙක් රැගෙන ගියේ ය. පෙරදින ඇති වූ වර්ෂාවෙන් තම දෙමාපියන් විසූ මාලිගාව කඩාවැටී දෙමාපියන් හා සහෝදරයාත් අහිමි ව උන්මත්තක ව ජේතවනාරාමයට ගියෙන් බුදුරජාණන් වහන්සේගෙන් දහම් අසා පැවිදි ව පටාචාරා රහත් තෙරණියක් වූවා ය.

**පූතිගත්ත තිස්ස හිමි**

පෙර භවයක දී කළ අකුසල කර්මයක් නිසාවෙන් කුෂ්ඨ රෝගයකට ගොදුරු වීමට උන්වහන්සේට සිදු විය. කිසිවකුගේ පිළිසරණක් නොමැති ව අසාධ්‍ය ව සිටි අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ මහා කරුණාවෙන් ආනන්ද හිමියන් සමඟ එහි වැඩම කොට උණු පැනින් නහවා පිරිසිදු කොට දහම් දෙසා රහත් වීමට මඟ විවර කර දුන්හ. උන්වහන්සේ රහත් වී පිරිනිවන් පෑහ.

iii. අධ්‍යාපනය ලැබීමට අඩුපාඩුකම් ඇති මිතුරු මිතුරියන්ට උදව් කිරීම.

මහලු අයට පාර මාරු වීමට අපහසු තැන්වල දී උදව් කිරීම.

ගමේ සිටින ගිලන් වූ අයට දෙමාපියන් සමඟ එක්ව උදව් කිරීම.

රෝගයන්ට ගොදුරු වී සිටින සතුන් ඇතොත් ප්‍රතිකාර කිරීම.

ගමේ දුප්පත් අසරණ අයට උපන් දිනයක් වැනි අවස්ථාවක දී කෑම බීම හෝ ඇඳුම් ආදිය පරිත්‍යාග කිරීම.

03. i. චාරිත්‍ර - අප විසින් කළ යුතු (යහපත්) දේවල් ය.

වාරිත්‍ර - අප විසින් නොකළ යුතු (අයහපත්) දේවල් ය.

ii. දෙමාපියන් වැඩිහිටියන් වාඩි වී සිටින අසුන්වලට වඩා උස් අසුන්වල වාඩි නොවීම.

එකට එක කියමින් දෙමාපියන් හා වැඩිහිටියන් සමග වාද නොකිරීම.

කිසිවෙකුට බාධා වන සේ ගුවන් විදුලි යන්ත්‍රාදිය භාවිත නොකිරීම.

වැසිකිළිය පාවිච්චි කොට ජල බඳුනේ ජලය ඉතිරි නොකිරීම.

iii. * යහපත් බොදු දරුවකු විය හැකි ය.

* සැමගේ ප්‍රශංසාවට ලක් වේ.

* නීරෝගිමත්, ප්‍රසන්න පුද්ගලයෙකු ලෙස සමාජයට පිවිසිය හැකි ය.

* අපමණ සතුටකින් ජීවත් විය හැකි ය.

* සැමගේ ආදරය දිනාගත හැකි ය.

04. i. අජිනි මං අහාසි මේ - යේ තං උපනය්හන්ති

ii. අසවලා මට බැන්නේ ය. මට පහර දුන්නේ ය. මා පරාජය කළේ ය. මා සතු දෙය පැහැර ගත්තේ ය. යනුවෙන් යම් අය නැවත නැවත සිතත් නම්, ඔවුන්ගේ වෛරය නොසන්සිඳේ.

iii. * යහපත් අයෙකු ලෙස කීර්ති නාමයක් පැතිරේ.

* යහපත් මිතුරන් ඇසුරට ලැබේ.

* බොහෝ මිතුරන් ඇසුරට ලැබේ.

* තමාට වෛර කරන්නන් ජීවිතයට එකතු නොවේ.

* මානසික සිත් තැවුල්වලින් මිදී බියෙන් සැකෙන් තොරව ජීවත් විය හැකි ය.

05. i. උතු නියාමය, බීජ නියාමය, කම්ම නියාමය, ධම්ම නියාමය, චිත්ත නියාමය

ii. පිත කිපීම නිසා, සෙම කිපීම නිසා, වාතය කිපීම නිසා, අනුන්ගෙන් බෝවීම නිසා, ඍතු විපර්යාස නිසා, වැරදි පුරුදු නිසා, විවිධ උපක්‍රම නිසා, කර්ම විපාක නිසා

iii. අසමත් වූ එකම කෙනා ඔබ පමණක් නොවේ. එනිසා කල්පනා නොකරන්න.

කර්මය නිසා ඔබ අසමත් වූවා නොවේ. එනිසා කල්පනා නොකරන්න.

එළඹෙන විභාගයට නැවත හොඳින් සූදානම් වන්න.

වීර්යවන්ත ව මහන්සි වී වැඩ කරන්න.

අවශ්‍ය සැමවිට ම මාගේ සහය ඔබට ලැබෙනු ඇත ආදි වශයෙන් පවසමින් මිතුරා දිරිමත් කර ඇත්නම් බලා ලකුණු පිරිනමන්න.

06. i. පොසොන් පොහොය දිනය / මිහින්තලා පව්වට (පර්වතයට)

ii. ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන මහ රහතන් වහන්සේලා, සුමන සාමණේරයන් වහන්සේ, භණ්ඩුක උපාසකතුමා

iii. අතීත උරුමවල වටිනාකම තේරුම් ගැනීම හා අන් අයට ඒවා කියා දීම.

පාසල තුළ දැනුවත් කිරීම සිදු කිරීම.

රැක ගැනීමේ වටිනාකම පහදා දෙමින් පුවත්පත්, සඟරා ආදියට ලිපි ලිවීම.

පැරණි ගොඩනැගිලි බැම් ආදිය මත ඇවිද යාමෙන් වැළකීම.

පැරණි චිත්‍ර, පිළිම ආදි කෞතුක වස්තු අතගෑමෙන් වැළකීම ආදි වශයෙන් බලා ලකුණු පිරිනමන්න.

07. i. පංච ශීලය

1. පාණාතිපාතා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
   (ජීවිත විනාශ කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.)
2. අදින්නාදානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
   (නොදුන් දෙය ගැනීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.)
3. කාමේසු මිච්ඡාචාරා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
   (කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.)
4 මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
   (බොරු කීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.)
5. සුරාමේරය මජ්ජපමා දට්ඨානා වේරමණී සික්ඛාපදං සමාදියාමි.
   (සුරාපානය කිරීමෙන් වැළකීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.)

ii. ශාසනික වචන ව්‍යවහාරය

බෞද්ධ සංස්කෘතියේ විවිධ ශාසනික වචන ඇත

| | |
|---|---|
| සිටිනවා | වැඩ සිටිනවා |
| නිදා ගන්නවා | සැතපෙනවා |
| අතු ගානවා | අමදිනවා |
| අනුභව කරනවා | වළඳනවා |
| තේ බොනවා | ගිලන්පස වළඳනවා |
| ඇවිදිනවා | සක්මන් කරනවා |
| ඇඳුම් අඳිනවා | සිවුරු පොරවනවා |
| කියනවා | දේශනා කරනවා / වදාරනවා |
| අත් සෝදනවා | අත් දෝවනය කරනවා |
| වතුර බොනවා | පැන් වළඳනවා |
| වතුර නානවා | පැන් පහසුවෙනවා |
| කොණ්ඩෙ කපනවා | හිස බානවා |

චෛත්‍ය රාජයාණන් වහන්සේ බෝධීන් වහන්සේ විහාර මන්දිරය මළුව පොඩි ස්වාමීන් වහන්සේ ආදි වශයෙන් වචන දහයක් පමණ ලියා ඇත්නම් උපරිම ලකුණු පිරිනමන්න.

iii. අග්‍රශෂ්‍ය දානය

අලුත් බත් දානය ලෙෂ ද හැඳින්වේ. කුඹුරුවලින් අස්වනු ලබා ගැනීමෙන් පසුව එහි පළමු කොටස තුනුරුවන්ට පූජා කිරීම අග්‍රශෂ්‍ය දානය යි. මේ දානය පිළියෙල කිරීමේදීත් පිළිගැන්වීමේදීත් විශේෂ සැලකිල්ලකින් එය සිදු කරනු ලැබේ. කිසිදු තැනක දී මෙම කොටස නිසාවෙන් වී ඇටයක් හෝ සැපීමක් කිසිවෙක් නොකරති. මේ චාරිත්‍රය ඉතාමත් ගෞරවයෙන් සිදු කරනු ලැබේ. පැරණි ගොවීහු වී අස්වැන්නේ මුල් කොටස පමණක් නොව සෙසු භෝගවල ද මුල් කොටස විහාරස්ථානයට ගෙන ගොස් පූජා කිරීම සිදු කළහ.

iv. අරහං බුදු ගුණය

බුදුරජාණන් වහන්සේ රහසින්වත් පව් නොකළ හෙයින් ද, ලෝභ, ද්වේශ, මෝහාදී සියලු කෙලෙස් නැසූ හෙයින් ද, සියලු පුද පූජාවන ලැබීමට සුදුසු හෙයින් ද අරහං නම් ගුණයෙන් යුක්ත වන සේක. වීදාගම මෛත්‍රීය හිමියන්ගේ බුදුගුණාලංකාර කෘතියේ කවියකින් එම ගුණය මෙසේ විස්තර වේ.

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**